# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත

---

[සහතිකය සටහන් කළේ **2006** මාර්තු මස **31** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 මාර්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 12.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

එල්.ඩී.—ඕ. 11/2006.

**2006 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන සෑම තක්සේරු වර්ෂයක ම සෑම කාර්තුවක් සම්බන්ධයෙන් ම යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක අදාළ පිරිවැටුම මත ආර්ථික සේවා ගාස්තුවක් පැනවීම සඳහා ද ; 2004 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටස සංශෝධනය කිරීම සඳහා ද ; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

I වන කොටස

## ආර්ථික සේවා ගාස්තුවක් පැනවීම

**2.** (1) (මේ පනතෙහි මින් මතු "අදාළ කාර්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන සෑම තක්සේරු වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා ම සෑම තැනැත්තකුගෙන් ම හා සෑම හවුල් ව්‍යාපාරයකින් ම, මේ පනතේ විධිවිධානවලට යටත්ව, ඒ අදාළ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ අදාළ පිරිවැටුමේ සෑම කොටසක් සම්බන්ධයෙන් ම, මේ පනතේ උපලේඛනයේ සඳහන් උචිත අනුප්‍රමාණයට අනුව මේ පනතේ විධිවිධානවලට යටත්ව (මෙහි මින්මතු "සේවා ගාස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආර්ථික සේවා ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය. ආර්ථික සේවා ගාස්තුවක් පැනවීම.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක පිරිවැටුම, ඒ අදාළ කාර්තුව සඳහා රුපියල් මිලියන දහය නොඉක්මවන අවස්ථාවල දී යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තාගෙන් හෝ හවුල් ව්‍යාපාරයෙන් අයකළ හැකි සේවා ගාස්තුව අයකරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, යම් අදාළ කාර්තුවක් සඳහා යම් තැනැත්තකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයකින් අයකල හැකි සේවා ගාස්තුව කිසිදු අවස්ථාවක දී රුපියල් මිලියන පහළොව නොඉක්මවිය යුතු ය.

2 - P L 001064 - 8,000 (2006/03)

(3) මේ වගන්තියෙහි—

(අ) "අදාළ පිරිවැටුම යන්නෙන් යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට හා යම් අදාළ කාර්තුවක් සම්බන්ධයෙන් කෙලින්ම හෝ අනුයෝජිතයකු හෝ අනුයෝජකයන් වැඩි ගණනක් මගින් ශ්‍රී ලංකාව තුළ අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන සෑම වෙළෙඳාමක ම, ව්‍යාපාරයක ම, වෘත්තියක ම හෝ රක්ෂාවක ම ඒ අදාළ කාර්තුව සඳහා වූ මුළු පිරිවැටුම අදහස් වේ :

එසේ වුව ද, යම් අදාළ කාර්තුවක් සඳහා වූ අදාළ පිරිවැටුම යන්නට ඒ අදාළ කාර්තුවේ ප්‍රථම දිනට පෙරාතුව ම වූ මාස තිස්හයක කාල පරිච්ඡේදය ඇතුළත වූ දිනයක ඒ තැනැත්තා විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් නැතහොත්, වෙනයම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් වාණිජ කටයුතු ආරම්භ කරන ලද යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ඒ අදාළ කාර්තුවේ පිරිවැටුම ඇතුළත් නොවිය යුතු ය.

ඉහතින් ම වූ අතුරු විධානයේ කාර්ය සඳහා, යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට අදාළව, "වෙළෙඳාම හෝ ව්‍යාපාරය" යන යෙදුමට, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් සෑදීම හෝ නිපදවීම නොකරන ලද භාණ්ඩ කිසිවක් තොග හෝ සිල්ලර වශයෙන් වෙළෙඳාම් කරන යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් ඇතුළත් නොවිය යුතු ය.

(ආ) "පිරිවැටුම" යන්නෙන්, යම් වෙළෙඳාමකට, ව්‍යාපාරයකට හෝ වෘත්තියකට හෝ රක්ෂාවකට හා අදාළ කාර්තුව සම්බන්ධයෙන් වන විට ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් කරගන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යාමේ දී ඇතුළත් වූ සෑම ගනුදෙනුවකින් ම ඇත්ත වශයෙන් ලැබුන ද නොලැබුන ද ලැබිය යුතු වන මුදල් ප්‍රමාණය—

(අ) පහත දැක්වෙන මුදල් ප්‍රමාණ අඩුකිරීමෙන් පසුව,—

(i) ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු

ලබන තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය ඒ ගනුදෙනුව කරන අවස්ථාවේදී, 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 10 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත්නම් පමණක්, ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් එකතු කල අගය මත බද්ද නියෝජනය වන මුදලක් වන ඒ මුළු මුදලම ඇතුළත් යම් මුදලක්,

(ii) ඒ මුදලේ ඇතුළත් වූ, යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමෙන් ලත් මුළු මුදල ; සහ

(iii) කලින් වූ යම් කාර්තුවක දී යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක පිරිවැටුමේ ඇතුළත්කර ඇත්තා වූ මුදල වන ඒ අදාළ කාර්තුව තුළ දී ඒ වෙළෙඳාමට, ව්‍යාපාරයට වෘත්තියට හෝ රක්ෂාවට දැරීමට සිදු වූ යම් බොල් ණය ප්‍රමාණයේ මුදල ; සහ

(ආ) කලින් වූ යම් කාර්තුවක දී කපාහරින ලද්දා වූ අවසර දෙන ලද්දා වූ යම් බොල් ණයක් වෙනුවෙන් ඒ අදාළ කාර්තුව තුළ දී ලැබුණු යම් මුදලක් එකතු කිරීමෙන් පසුව ඒ මුදල,

අදහස් වේ :

එසේ වුව ද—

(අ) බැංකුවක් සම්බන්ධයෙන් වන විට, පොලිය, වත්කම්, ලාභාංශ, විනිමය, සේවා ගාස්තු, කොමිස් මුදල්, තැරැව් ගාස්තු හෝ එහි ව්‍යාපාරික ක්‍රියාමාර්ගවල දී, බැංකුවට ලැබෙන වෙනත් යම් ආදායමක් ඒ බැංකුවේ පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) රක්ෂණ ව්‍යාපාරය කරගෙන යන තැනැත්තෙක් සම්බන්ධයෙන් වන විට—

(i) ජීවිත රක්ෂණ ; සහ

(ii) වැඩ වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සිදුවන අලාභහානි හෝ

විනාශවීම් පිළිබඳ රක්ෂණ වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලට ගෙවන ලදුව, ලැබුණු හෝ ලැබිය යුතු රක්ෂණ වාරික, ඒ තැනැත්තාගේ පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

අදාළ ආදායම් බද්දෙන් සේවා ගාස්තුව අඩුකල යුතු බව.

**3**. (1) යම් අදාළ කාර්තුවක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවන ලද යම් සේවා ගාස්තුවක ප්‍රමාණය ඒ අදාළ කාර්තුව ඇතුළත් වන්නා වූ (මෙහි මින්මතු "පළමුවෙන් සඳහන් කළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බද්දක් වෙතොත් එයින් අඩුකරනු ලැබිය යුතු ය.

(2) යම් අදාළ කාර්තුවක් සඳහා යම් හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවන ලද යම් සේවා ගාස්තුවක ප්‍රමාණය, ඒ අදාළ කාර්තුව ඇතුළත් වන්නා වූ තක්සේරු වර්ෂය සඳහා ඒ හවුල් ව්‍යාපාරයේ ලාභ හෝ පාඩු හවුල්කරුවන් අතර විභජනය කෙරුනු අනුපාතයටම විභාජනය කරනු ලැබිය යුතු ය. යම් හවුල්කරුවකු වෙත එසේ බෙදා වෙන්කර දෙන සේවා ගාස්තු ප්‍රමාණය ඒ අදාළ කාර්තුව ඇතුළත් වන්නා වූ (මෙහි මින් මතු "පළමුව සඳහන් කරන ලද තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) තක්සේරු වර්ෂය සඳහා ඒ හවුල්කරු විසින් ගෙවිය යුතු ආදායම් බද්දක් වෙතොත්, එයින් අඩුකරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියට අනුකූලව අඩුකිරීමෙන් පසුව, යම් තැනැත්තකු විසින් ගෙවන ලද ඒ සේවා ගාස්තුවේ ශේෂයක් වෙතොත්, එය (මෙහි මින් මතු "පළමුව එළඹෙන තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළමුවෙන් සඳහන් කළ තක්සේරු වර්ෂයට පසුව එළඹෙන තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියට අනුකූලව අඩුකිරීමෙන් පසුව, (2) වන උපවගන්තියට අනුකූලව, යම් හවුල්කරුවකු වෙත විභාජනය කරන ලද යම් සේවා ගාස්තුවක ශේෂයක් වෙතොත්, එය (මෙහි මින් මතු "පළමුව එළඹෙන තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළමුව එළඹෙන තක්සේරු වර්ෂය සඳහා ඒ හවුල්කරු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකරනු ලැබිය යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි, (3) වන උපවගන්තියට හෝ (4) වන උප වගන්තියට අනුකූලව අඩුකිරීමෙන් පසුව, අවස්ථාවෝචිත පරිදි, (3) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ සඳහන් ශේෂයේ ඉතිරි

කොටසක් වෙතොත්, එය, (මෙහි මින්මතු “දෙවනුව එළඹෙන තක්සේරු වර්ෂය” යනුවෙන් සඳහන් කරනු ලබන) පළමුව එළඹෙන තක්සේරු වර්ෂයට පසුව ම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ ඒ හවුල් ව්‍යාපාරයේ ඒ හවුල්කරු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකරනු ලැබිය යුතු ය.

(6) කිසිම අවස්ථාවක දී—

(අ) අවස්ථාවෝචිත පරිදි, යම් තැනැත්තකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක යම් හවුල්කරුවකු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්, අවස්ථාවෝචිත පරිදි ගෙවන ලද හා යම් හවුල්කරුවකු වෙත විභාජනය කරදෙන ලද සේවා ගාස්තු ප්‍රමාණයේ මුළු අඩුකිරීම් ඒ සේවා ගාස්තු ප්‍රමාණය නොඉක්මවිය යුතු ය ;

(ආ) (5) වන උපවගන්තියට අනුකූලව අඩුකිරීමෙන් පසුව, (5) වන උපවගන්තියෙහි සඳහන් ශේෂයේ ඉතිරි කොටස, දෙවනුව එළඹෙන තක්සේරු වර්ෂයෙන් පසුව එළඹෙන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකරනු නොලැබිය යුතු ය.

සේවා ගාස්තුවේ ඉතිරි කොටස ආපසු නොගෙවිය යුතු බව.

**4**. යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, (3) වන වගන්තියේ (6) වන උපවගන්තියේ (ආ) අනුඡේදයෙහි සඳහන් සේවා ගාස්තුවේ ඉතිරි කොටස ආපසු නොගෙවිය යුතු ය.

අයකලහැකි බව පිළිබඳ දැන්වීම.

**5**. යම් අදාළ කාර්තුවක් සඳහා සේවා ගාස්තුව අයකළ හැකි හෝ අයකල හැකි වීමට ඉඩක් ඇති සෑම තැනැත්තකු, සෑම හවුල් ව්‍යාපාරයක් විසින් ම, ඒ අදාළ කාර්තුවේ අවසාන මාසයේ පසළොස්වන දිනට පෙර, කොමසාරිස් ජනරාල්වරයා අමතන ලද ලියවිල්ලකින් වූ සන්නිවේදනයක් මගින්, ඒ අයකල හැකි බව හෝ අයකල හැකි වීමට ඉඩ ඇති බව පිළිබඳව දැනුම් දිය යුතු ය. ඒ සන්නිවේදනයෙන්, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට නියම කරනු ලැබ ඇති ආදායම් බදු ලිපි ගොනු අංකය හෝ පෞද්ගලික හඳුනාගැනීමේ අංකය හෙළිකරනු ලැබිය යුතු ය.

සේවා ගාස්තුව ගෙවිය යුතු දිනය.

**6**. යම් අදාළ කාර්තුවක් සඳහා, යම් තැනැත්තකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයකින් අඩු කළ හැකි සේවා ගාස්තුව, තක්සේරුකරුවකු විසින් ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය පිළිබඳ කිසිදු තක්සේරුවක් කර නොමැත්තේ වුව ද, ඒ අදාළ කාර්තුවේ අවසානයෙන් පසුව එළඹෙන මාසයේ විසිවන දින හෝ ඊට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

වාර්තා ඉදිරිපත් කිරීම.

**7**. යම් අදාළ කාර්තුවක් සඳහා සේවා ගාස්තුව ගෙවිය යුතු සෑම තැනැත්තකු හා හවුල් ව්‍යාපාරයක් විසින් ම, තක්සේරුකරුවකු විසින් නියම කරනු ලැබුව ද නොලැබුව ද, ඒ අදාළ කාර්තුවේ අවසානයට පසුව ම එළඹෙන මාසයේ විසිවන දින හෝ ඊට පෙර, අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ හෝ එහි අදාළ පිරිවැටුම පිළිබඳව, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ආකෘතියක සහ යම් විස්තර ඇතුළත් වාර්තාවක් තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. වාර්තාවේ, සේවා ගාස්තුව ගණන් බැලීමේ පදනම හා මේ වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් විස්තර ද පෙන්නුම් කරනු ලැබිය යුතු ය.

වාර්තා පවත්වාගෙන යාම.

**8**. සේවා ගාස්තුව අයකළ හැකි සෑම තැනැත්තකු හා හවුල් ව්‍යාපාරයක් විසින්ම ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන සෑම වෙළෙඳාමක, ව්‍යාපාරයක, රක්ෂාවක හෝ වෘත්තියක ම ගනුදෙනු පිළිබඳ වාර්තාවක්, මේ පනතේ 7 වන වගන්තිය යටතේ ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ඉදිරිපත් කරන ලද පිරිවැටුම් වාර්තාව සැසඳීම පහසු කෙරෙන යම් ආකාරයකින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවලදී තක්සේරුකරු විසින් තක්සේරු කිරීම කළ යුතු බව.

**9**. යම් අදාළ කාර්තුවක් සඳහා, සේවා ගාස්තු අයකල හැකි යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්—

(අ) සේවා ගාස්තුව ගෙවා නොමැති බවට ; හෝ

(ආ) ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින්, අදාළ කාර්තුව සඳහා සේවා ගාස්තුව වශයෙන් ගෙවිය යුතුව තිබූ මුදලට වඩා අඩු මුදලක් ගෙවා ඇති බවට,

තක්සේරුකරුවකුගේ මතය වන්නා වූ අවස්ථාවක, ඒ අදාළ කාර්තුව සඳහා, ඔහුගේ මතය අනුව, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපරය සේවා ගාස්තුව වශයෙන් ගෙවිය යුතු ව තිබූ මුදල, ඒ තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලැබිය හැකි අතර ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්—

(i) ඒ අදාළ කාර්තුව සඳහා ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් යම් සේවා ගාස්තුවක් ගෙවා නොමැති නම්, ඒ අදාළ කාර්තුව සඳහා එසේ තක්සේරු කරන ලද සේවා ගාස්තුවේ ප්‍රමාණය ; හෝ

(ii) ඒ අදාළ කාර්තුව සඳහා සේවා ගාස්තුව වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවා ඇත්නම්, එසේ තක්සේරු කරන ලද සේවා ගාස්තු ප්‍රමාණය හා ඒ අදාළ කාර්තුව සඳහා ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ඇත්ත වශයෙන් ම ගෙවන ලද සේවා ගාස්තු ප්‍රමාණය අතර ඇති වෙනස,

වහාම ගෙවන ලෙස ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට නියම කරනු ලැබිය යුතු ය.

නොගෙවා ඇති සේවා ගාස්තුව පැහැර හරිනු ලැබූ ලෙස සැලකිය යුතු බව.

**10.** (1) යම් සේවා ගාස්තුවක් ගෙවීම සඳහා 6 වන වගන්තියේ නිශ්චිත දක්වා ඇති දින හෝ ඊට පෙර, යම් අදාළ කාර්තුවක් සඳහා යම් සේවා ගාස්තුවක් හෝ ඒ සේවා ගාස්තුවේ කොටසක් නොගෙවා ඇති අවස්ථාවක, ඒ වාරිකය හෝ එහි කොටස පැහැර හරිනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(2) පැහැර හරිනු ලැබූ සේවා ගාස්තුව හෝ එහි කොටස—

(අ) පුද්ගලයකු විසින් ;

(ආ) හවුල් ව්‍යාපාරයක් විසින් ;

(ඇ) සමාගමක් විසින් හෝ පුද්ගල මණ්ඩලයක් විසින්,

ගෙවිය යුතු අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ පුද්ගලයා ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු හෝ ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් ප්‍රධාන නිලධරයකු, මේ පනතේ කාර්ය සඳහා පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

දේශීය ආදායම් පනතේ ඇතැම් විධිවිධාන අදාළ විය යුතු බව.

**11.** දේශීය ආදායම් පනතේ XXIII, XXIV, XXV, XXVI , XXVII XXVIII, XXIX, XXX සහ XXXI, වන පරිච්ඡේදවල විධිවිධාන, පිළිවෙලින් අභියාචන, තක්සේරු කිරීම්වල අවසානාත්මකභාවය සහ වැරදි වාර්තා සම්බන්ධයෙන් දණ්ඩනය, පැහැර හරින ලද බද්ද, බදු අයකර ගැනීම, විවිධ කරුණු, ආපසු ගෙවීම, වැරදි සහ දණ්ඩන පරිපාලනය සහ පොදු කරුණුවලට, අදාළ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව මේ පනත යටතේ පිළිවෙලින් අභියාචනා තක්සේරු කිරීම්වල අවසානාත්මකභාවය, වැරදි වාර්තා, පැහැරහරිනු ලැබූ සේවා ගාස්තුව සහ එයට එකතු කරනු ලබන මුදල්, සේවා ගාස්තුව අයකර ගැනීම, විවිධ කරුණු, ආපසු ගෙවීම, දණ්ඩන සහ වැරදි, පරිපාලනය සහ පොදු කරුණු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

නියෝග.

**12**. (1) නියමකරු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදිය යුතු යයි මේ පනත යටතේ නියමකරනු ලැබ ඇති හෝ බලය දී ඇති සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් හා (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්—

(අ) 2 වන වගන්තියේ කාර්ය සඳහා, ඒ වගන්තියේ "පිරිවැටුම" යන යෙදුමේ අර්ථනිරූපණයට ඇති අතුරු විධානය අදාළ නොවන අවස්ථා සම්බන්ධයෙන් යෙදෙන විට "පිරිවැටුම" යන යෙදුමේ අර්ථය තහවුරු කර ගැනීමට අදාළ මාර්ගෝපදේශ නියම කරමින් ; සහ

(ආ) 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් ගාස්තු අය නොකිරීම කිරීමේ හෝ නොකිරීමේ අවස්ථා අදාළ කිරීම නියම කෙරෙමින්.

නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය පළකරනු ලැබූ දින හෝ එහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසුව හැකි පහසු ඉක්මණින් අනුමතිය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක් ම, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සළකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

අර්ථනිරූපණය.

**13**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අනුයෝජිතයා", "ක්ෂයවීම සඳහා වූ දීමනාව" හා "තක්සේරුකරු" යන්නට දේශීය ආදායම් පනතෙහි ඒවාට දී ඇති ඒ ඒ අර්ථයන් ම ඇත්තේ ය ;

"ආයෝජන මණ්ඩල ව්‍යවසාය" යන්නෙන්, යම් අදාළ කාර්තුවකට අදාළව, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ යම් ව්‍යවසායක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ඇතිකරගත් යම් ගිවිසුමක් ප්‍රකාර, එහි ලාභ හා ආදායම ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇති අදාළ කාර්තුව තුළ හෝ එහි යම් කොටසක් තුළ පවතින යම් ව්‍යවසායක් අදහස් වේ ;

"පුද්ගල මණ්ඩලය", "ව්‍යාපාරය", "ප්‍රාග්ධන වත්කම්" "කොමසාරිස් "ජනරාල්" සහ "සමාගම" යන්නට, දේශීය ආදායම් පනතේ, ඒවාට දී ඇති ඒ ඒ අර්ථයන් ම ඇත්තේ ය ;

"බෙදාහරින්නා" යන්නෙන්, ශ්‍රී ලංකාවේ යම් භාණ්ඩ යම් නිෂ්පාදකයකුට හෝ සාදන්නකුට අදාළව, එම නිෂ්පාදකයා හෝ සාදන්නා කලින් කල තීරණය කරනු ලබන මිළකට එම භාණ්ඩ තොග වෙළෙඳපොළේ අළෙවි කිරීම සඳහා එම නිෂ්පාදකයා හෝ සාදන්නා විසින් පත් කරනු ලබන යම් තැනැත්තෙක් හෝ හවුල් ව්‍යාපාරයක් අදහස් වේ ;

"දේශීය ආදායම් පනත" යන්නෙන්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හෝ ආදායම් බදු අයකිරීම් සඳහා විධිවිධාන සලසන පනතක් අදහස් වේ ;

"හවුල් ව්‍යාපාරය", "ලැබුණු මුදල්" සහ "ලාභ හෝ ආදායම" යන්නට, දේශීය ආදායම් පනතේ, ඒවාට දී ඇති ඒ ඒ අර්ථයන් ම ඇත්තේ ය ;

"තැනැත්තා" යන්නට, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වන නමුත්, ඊට—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථානුකූල යම් ලියාපදිංචි කළ සමිතියක් ;

(ආ) ගුවන් යානයක හෝ නැවක් අයිතිකරුවකු හෝ කුලියට ගත් තැනැත්තකු ලෙස ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන යම් අනේවාසික තැනැත්තකු,

ඇතුළත් නොවේ ;

"කාර්තුව" යන්නෙන් යම් තක්සේරු වර්ෂයකට අදාළව, ඒ තක්සේරු වර්ෂයේ පිළිවෙලින් අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් හෝ ජනවාරි මාසවල පළමුවන දිනයෙන් ආරම්භවන මාස තුනක කාල පරිච්ඡේදය අදහස් වේ ;

"ව්‍යවස්ථාපිත ආදායම", "බදු අයකළ හැකි ආදායම", "වෙළෙඳාම" සහ "තක්සේරු වර්ෂය" යන්නට, දේශීය ආදායම් පනතේ, ඒවාට දී ඇති ඒ ඒ අර්ථයන්ම ඇත්තේ ය.

## II වන කොටස

## 2004 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටස සංශෝධනය කිරීම

2004 අංක 11 දරන පනතේ 1 වන කොටස සංශෝධනය කිරීම.

**14**. 2004 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (මේ පනතෙහි මෙහි මින් මතු "අදාළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) "2004 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන" යන වචන වෙනුවට, "(මේ පනතෙහි මෙහි මින් මතු "අදාළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2004 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සහ 2006 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන" යන වචන ආදේශ කිරීමෙන්.

(2) 2005 අංක 7 දරන පනතින් ඇතුළත් කරන ලද, 7 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "(2) වන කරුණ" යන ඉලක්කම් සහ වචන වෙනුවට, "(3) වන කරුණ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

2004 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටස අදාළ නොකළ යුතු බව.

**15**. 2006 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් අදාළ තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්, යම් තැනැත්තකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයකින් ආර්ථික සේවා ගාස්තුව අයකිරීම කෙරෙහි 2004 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ විධිවිධාන අදාළ නොවිය යුතු බව සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**16**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වූ අවස්ථාවක, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය (2 වන වගන්තිය)

| *යටත් පිරිවැටුමේ කොටස* | *ඒ කොටසට අදාළවන සේවා ගාස්තු අනුප්‍රමාණය* |
|---|---|
| 1. ලාභ හා ආදායම ආදායම් බද්දෙන් නිදහස් කෙරෙන යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාල වන පිරිවැටුමේ යම් කොටසක් | සියයට 0.25 |
| 2. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ගිවිසුමකට එළඹ ඇති යම් ව්‍යවසායක යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්— | |
| (i) එම ව්‍යවසායේ ලාභ සහ ආදායම එම ගිවිසුම යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇත්තේ යම් කාල සීමාවක් සඳහා ද, එම කාලසීමාව ඇතුළත අදාළ පිරිවැටුම් මත | සියයට 0.25 |
| (ii) එම ව්‍යවසායේ ලාභ සහ ආදායම මත දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණයකට සමාන අනුප්‍රමාණයකට බදු අය කළ හැකි වනුයේ යම් කාලසීමාවක් සඳහා ද, එම කාලසීමාව ඇතුළත අදාළ පිරිවැටුම් මත | සියයට 0.50 |

| යටත් පිරිවැටුමේ කොටස | ඒ කොටසට අදාළවන සේවා ගාස්තු අනුප්‍රමාණය |
| --- | --- |
| 3. දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 28 වන අයිතමය හැර එම උපලේඛනයේ සඳහන් යම් අනුප්‍රමාණයකට අනුව ලාභ සහ ආදායම මත ආදායම් බදු අයකළ හැකි යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාල වන පිරිවැටුමේ යම් කොටසක් | සියයට 0.5 |
| 4. දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ සඳහන් යම් අනුපාතයක් නොවන අනුප්‍රමාණයකට අනුව, ලාභ හා ආදායම මත ආදායම් බදු අයකළහැකි යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන ලාභ හා ආදායමේ පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාල වන පිරිවැටුමේ යම් කොටසක් | සියයට 1.0 |
| 5. යම් වෙළෙන්දකු විසින් සාදනු නොලැබූ හෝ නිපදවනු නොලැබූ යම් භාණ්ඩ තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් වෙළෙඳාම් කරන (බෙදා හරින්නකු හැර) යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි අදාළ වන පිරිවැටුමේ යම් කොටසක් | සියයට 0.5 |
| 6. යම් මද්‍යසාරමය පානයක් නිපදවීමේ දී සිදු කරන පරිවර්තනයක් නොවන තේ, රබර් හෝ පොල් වැවිල්ලක යම් මූලික නිෂ්පාදන පරිවර්තනයකින් ලැබෙන පිරිවැටුමට ඇතුළත් වන පරිදි අදාල වන පිරිවැටුමේ යම් කොටසක් | සියයට 0.5 |

| | | |
|---|---|---|
| 7. | බෙදාහරින්නකුගේ යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් උද්ගත වන යම් පිරිවැටුමක් සංයුක්ත වන අදාළ පිරිවැටුමේ එම කොටස | සියයට 0.1 |
| 8. | පවත්වාගෙන යනු ලබන යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් නැතහොත් දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 28 වන අයිතමයේ සඳහන් යම් ක්‍රියාකාරකමකින් උද්ගත වන යම් පිරිවැටුමක් සංයුක්ත වන අදාළ පිරිවැටුමේ එම කොටස | සියයට 1.0 |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක **32**, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස **15** වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.